# ලංකාණ්ඩුවේ "ගැසැට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,115—1943ක්වූ අප්‍රේල් මස 30 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3ගේ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්‍ය්‍යයක්, එනම්:— වැලිමඩ වවුගම කුඩාකඩල වැලලීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නො. 55ගේ අන්තිම ගම් සිතියමේ නො. 9ගේ අතිරේකය. ගම—දිවිතොටවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්හා. | මනන, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 42 | සිල්පොලඅරණවෙහේන .. | පතන .. | ආර්. දිවිතොටවෙල හිටපු රටේ මහත්මයා .. | 0 1 33·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ හැටියට තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1943ක්වූ මැයි මස 27වෙනි දින පෙරවරු 11ගේ කාලයට වැලිමඩ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිවාසිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1943ක්වූ අප්‍රේල් මස 21වෙනි දින
බදුල්ලේ කච්චේරියේදීය.

සී. කුමාරසවාමි,
ආණ්ඩුවේ ඒජන්ත වරයා.

65——J. N. A 23792—62 (4/43)
S 1

## අන්‍ය දැන්වීම.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ නිල්දන්ඩාහින්නේ පදිංචි කසෙමලගේ ඩුලියෙස්හෝනා වන මම බදුලු දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් ඔප්පු තිරප්පු ආදියේ කටයුතුකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරනුලැබීම පිණිස මෙදින සිට මාස තුනක් ගතවූ පසු රීජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත ඉල්ලුම්කරණ බව නොතාරිස් ආඥාපනතේ 91වෙනි පරිච්ඡේදයේ B උප ලේඛණයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

මම 1943ක්වූ පෙබරවාරි මස 1වෙනි දින
නිල්දන්ඩාහින්නේදීය.

කේ. ඩුලියෙස්හෝනා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.